# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය

## ලංසු කැදවීම

## IFB:-RDA/EE/MON/2024/01

මාර්ග සංවර්ධන අධිකාරියේ මොනරාගල විධායක ඉංජිනේරු කාර්යාලීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය, මොනරාගල විධායක ඉංජිනේරු කොට්ඨාශයේ මාර්ග සංවර්ධන හා නඩත්තු කටයුතු සදහා අවශ්‍ය යන්ත්‍ර (බැකෝ ලෝඩර්) සපයා ගැනීම සදහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් සැපයුම්කරුවන්ගෙන් වෙන වෙනම මුද්‍රා තබන ලද ලංසු කැදවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | ලංසු කැදවුම් අංකය | ස්ථානය | කාල සීමාව | ප්‍රමාණය | ඇස්තමේන්තු මුදල (මිලියන) | ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 01 | බැකෝ ලෝඩර් | RDA/EE/MON/ TBQ/2024/92 | පැල්වත්ත අංගනය | මාස 05 | පැය 800 | 5 | රු.5.000.00 |
| 02 | බැකෝ ලෝඩර් | RDA/EE/MON/ TBQ/2024/93 | බෝදාගම අංගනය | මාස 05 | පැය 800 | 5 | රු.5.000.00 |

1. ලංසු කැදවීම ජාතික ලංසුකරණ පටිපාටිය අනුව සිදු කරනු ලැබේ.

2. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 153 ක් (2024.12.31) දක්වා ලංසුව වලංගු විය යුතුය.

3. ලංසු ඉහත වගුවේ දැක්වෙන වටිනාකමින් යුත් ලංසු ආරක්ෂණයකින් සමන්විත විය යුතුය. (2024.12.31 දින දක්වා වලංගු විය යුතුය) එය පිළිගත් බැංකුවකින් පළාත්භාර අධ්‍යක්ෂ (ඌව) යන නමට ලබාගත් ලංසු ඇපකරයක් හෝ පළාත්භාර අධ්‍යක්ෂ (ඌව) ලංකා බැංකුව බණ්ඩාරවෙල ශාඛාවේ ගිණුම් අංක 2068132 වෙත මුදලින් තැන්පත් කොට ලබා ගන්නා ලදුපත ඉදිරිපත් කළ යුතුවේ. වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. මිළ ගණන්පත් ගෙවීමකින් තොරව විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය මොනරාගල වෙතින් පරික්ෂා කර බැලිය හැකිය.

5. මේ සදහා ඉදිරිපත් වන ලංසු කරුවන් 2024.06.14. වන දින සිට 2024.07.05 වන දින දක්වා පෙ.ව.9.00 සිට ප.ව.15.00 පැය කාර්යාල වේලාව තුල ආපසු නොගෙවනු ලබන රු.1,000.00 (බදු රහිත) ගාස්තුවක් විධායක ඉංජිනේරු කාර්යාලය මාර්ග සංවර්ධන අධිකාරිය මොනරාගල වෙත ගෙවීමෙන් අනතුරුව ලංසු අයදුම්පතක් ලබාගත හැකිය.

6. ලංසුපත් සම්බන්ධ වැඩි විස්තර ලංසුපත් සමග ඉදිරිපත් කරනු ලැබේ.

7. සම්පූර්ණ කළ මුද්‍රා තබන ලද මිල ගණන්පත් 2024.07.05 වන දින ප.ව.15.30 ට හෝ ඊට පෙර **"විධායක ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය, මොනරාගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතුය.

8. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. ඔබගේ ලංසුපත් පහා එවන කවරයේ වම්පස් ඉහළ කෙළවරෙහි අදාල ලංසු කැදවීම් අංකය සදහන් කල යුතුය.

10. සියළු විමසීම් සදහා දුරකථන අංකය 055-2276047

සභාපති
ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව
විධායක ඉංජිනේරු කාර්යාලය
මොනරාගල